# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2112/41 – 2019 පෙබරවාරි මස 28 වැනි බ්‍රහස්පතින්දා – 2019.02.28**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, පොළොන්නරුව නැගෙනහිර ජල සම්පාදන ව්‍යාපෘති යටතේ, සේවාගම භූගත ජලාශය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**රවුෆ් හකීම්,**
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 පෙබරවාරි මස 15 වැනි දින,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
අංක 35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
5/2/1/1433

උපලේඛනය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 200, සේවාගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සේවාගම ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද අංක එෆ්සීපී පො 13 හි පත්‍ර අංක 52 හි

අතිරේක අංක 40 දරන සැළැස්මේ කැබලි අංක 1049න් කොටසක් වශයෙන් දැක්වෙන ''අලි කොටුව අංක 105'' නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 80 ක් පමණ වන ඉඩම් කොටස.

කැබලි අංක : අංක 1049 න් කොටසක්
ඉඩමේ නම : අලි කොටුව අංක 105
ප්‍රමාණය : පර්චස් 80
මායිම් :

උතුරට : කැබලි අංක 1049 දරන මෙම ඉඩමේ ඉතිරි කොටස;
නැගෙනහිරට : කැබලි අංක 1049 දරන මෙම ඉඩමේ ඉතිරි කොටස;
දකුණට: : කැබලි අංක 1049 දරන මෙම ඉඩමේ ඉතිරි කොටස;
බටහිරට : කැබලි අංක 1795 දරන ඉඩම් කොටස.

ඉහත සඳහන් ඉඩම් කොටසට හිමිකම් කියන අයගේ නම සහ ලිපිනය :

1. ඩබ්ලිව්. ජී. ප්‍රේමදාස මහතා,
අංක 149, යාය 09 පාර,
වැවේතැන්න,
පොළොන්නරුව.

03 – 767

---

## ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, 2017.08.28 දිනැති අංක 2034/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 1ඒ පිටුවේ අංක 09 - 264 යටතේ පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙහි ග්‍රාම නිලධාරි කොට්ඨාසය අංක 659, දීකිරිමඩවල යනුවෙන් සඳහන් වුවත්, එය ග්‍රාම නිලධාරි කොට්ඨාස 2 කට අයත් බැවින්, සිරිමල්වත්ත - පල්ලේගම ග්‍රාම නිලධාරි කොට්ඨාසය ද ඊට ඇතුළත් විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**රවුෆ් හකීම්,**
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 පෙබරවාරි මස 15 වැනි දින,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
අංක 35, 'ලක්දිය මැදුර',
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත,
බත්තරමුල්ල.
5/2/1/1275

03 – 754

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.